


"වෙට් ෆෑට් කේක් !"

"තෙත පළතුරු කේක් ගැන මොකක් ද මේ කියන්නේ ?" පැන්සල පන්හිඳගෙන් ඇහුවා. පන්හිඳයි, පින්සලයි දිනපතාම වැඩට යන්නේ කෝච්චියේ එකට. ඒත් පැන්සල වෙන පැත්තකයි වැඩ කරන්නේ. පන්, පින් දෙන්නා වැඩ කරන පැත්තේ මොකක් ද උවමනාවකට පැන්ට යන්න වෙලා. ඉතින් පැන්, පන් - පින්ට එකතු වුණා.

ඉස්ටේසමක් ළං වෙනකොට කෝච්චියේදී ඒ ඉස්ටේසමේ නම කියලා නිවේදනයක් ප්‍රචාරය වෙනවනේ. ඒ ප්‍රචාරය වුණ එක ඉස්ටේසමක නම පැන්ට ඇහුණ විදිය තමයි ඔය.

"වෙට් ෆෑට් කේක් "

"කෑ ගහන්න එපා....." පන් පැන්ට එරෙව්වා. හැදෙනකල්ම සින්දුවක් වෙන්නේ පද පෙළට තනුවක්, සංගීතයක් එකතුවෙලා කවුරු හරි ශිල්පියෙක් ගායනය කළා ම."

"සංගීතයක් නිර්මාණය කරගන්නට ඒවා වාදනය කරන්න කට්ටියකුත් එපායැ. නැත්තං ඒක සංගීතයක් වෙන්නෙ නෑනෙ. පින්, පන්ගේ කතාවට හවුල් වුණා.

"ඇයි තාක්ෂනේ ?" පැන් ආයෙමත් තමන්ගේ මාතෘකාව ගත්තා." හරියට ඕව රෙකෝඩ් කරගත්තෙ නැත්තං අපට අහන්න වෙන්නේ සිංදු නෙවෙයි."

නොගියම." පන් කෙටියෙන් උත්තර බැන්දා.

"ඉතින් ඔය හැම දෙයක් ම සියයට සීයක් හරියටම කරන්න පුළුවන් කියලා පන් හිතනව ද?" පින් ආයෙමත්.

"එතකොට සමහර අය කියන්නෙ හිතුවටත් වැඩිය හොඳින් වැඩේ කෙරුණා කියලා....." පින්ගේ ප්‍රශ්ණ පැටව් දානවා."

"ඔය හැම දෙයක් ම සාපේක්ෂයිනේ. එක එක්කෙනා යමක් කරලා බලාපොරොත්තු වෙන දේ ඒ ඒ අය මත්තෙ රඳ පවතිනවා. තමන් හිතුවට වඩා හොඳට යමක් කරගන්න ලැබෙන්නේ ඒ අය හිතුවෙ නැති විදියට අනික් අයගේ සහයෝගය, අවශ්‍ය කරන දේ ලැබිලා වැඩේ සාර්ථක වුණාම. තමන් සැළසුම් කරපු දේ ට වඩා වැඩි යමක් ඒ කාර්ය වෙනුවෙන් ලැබුණාම." පැන් ම උත්තර දුන්නා.

"මමම නම් අදහන දෙයක් තියෙනවා. වැඩක් කරන්න පටන් ගන්නකොට. මුලින් තමන් තමන්ට ම අවංක වෙන්න ඕන. තමුන්ගේ හෘදය සාක්ෂියට එකඟව. අවංකව හොඳ යමක් සද්භාවයෙන් පටන් ගත්තොත් ඒක වරදින්නෙ නෑ. හිතුවටත් වැඩිය සාර්ථක වෙන්නෙත් ඒ වගේ කටයුතු තමයි. ඒ පන්.

# "වෙට් ෆෑට් කේක්"

ඔය කියන්නෙ "වෙට් ෆෑට් කේක් " එකක් ගැන නෙවී. "වේස්ට් ෆුට්ස්ක්‍රේ" ස්ටේෂන් එකේ නම."



"හැබෑවට ම හැමදාම කෝච්චියේ යන මටත් ඔය විදියට තමයි ඔය නම කියනවා ඇහෙන්නේ. "පින්සලත්, පැන්සලගේ කීමට එකඟයි. "ඒ විතරක් නෙවෙයි; වෝටර් ගාඩින් කියන එකත් ඇහෙන්නෙ " මෝටර් ගාඩින් " වගෙයි. මං හිතුවේ මගේ කනේ දෝෂයක්වත් ද කියලා.

"ඒක වෙන්නත් පුළුවන් සමහරවිට" පන් හිනා-වුණා. මොනවා වුණත් " කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුයි" කියල කියමනකුත් තියෙනවනේ...."

"මං හිතන්නේ ඒ නි-වේදිකාවගේ ප්‍රශ්ණයක් නෙවෙයි මේ. ප්‍රචාරය වෙන සවුන්ඩ් සිස්ටම් එක ඒ තරම් හොඳ මදි." තාක්ෂණය ගැන කවදත් උනන්දු වෙන පැන්සල මේක කෝච්චියේ ශබ්ද වාහිනි යන්ත්‍ර ජාලයේ අඩු පාඩුවක් විදියට හිතුවා.

"නිවේදිකාවට හෙම්බිරිස්සාව හැදිලා උන්නද දන්නෑ. ඕක රෙකෝඩ් කරපු දවසේ......" පින්ගේ කතාවට පන්ටයි පැන්ටයි හිනා.

වැඩක් හරියාකාරව ඉවරයක් වෙන්න කීයක් නං දෙනෙක් ඒකට හරි විදියට දායක වෙන්න ඕන ද ? කීයක් නං දේවල් හරි විදියට එකට පෑහෙන්න ඕන ද ? පැන්ගේ ඒ කතාවට පන්, පින් දෙන්න ට එකඟයි.

"දැන් අපි අහන සින්දුවක් ගනිමු. රචකයෙක් පද පෙළක් ලිව්ව පමණින් එක සින්දුවක් වෙනවද ? හොඳ අදහසක් වෙන්න පුළුවන්. හොඳ ආකෘතියක් වෙන්න පුළුවන්. ලස්සන වඩන, අළුත් යෙදුම් වෙන්න පුළුවන්. ඒත් ඒක පද වැලක් විතරයි. ඒකට තනුවක්

"හරියට වෙට් ෆෑට් කේක් වාගේ."

"හරි දේවල් හරි අයත් එක්ක හරියට ගැලපිලා හරි අවබෝධයකින්, හරි සහයෝගයකින් හරි දෙයක් නොකළොත්, ඒකෙන් කාටවත් හරි දෙයක් ලැබෙන්නෙ නෑ." පන්හිඳ කරුණු ගොනු කළා කොයි දේටත් හරියන විදියට.

"ඒක හරි !" පින් පැන් දෙන්නත් එකටම එකඟයි ඒකට.

"එකට කට්ටිය එකතු වෙලා එකම විදියට කරපු දේවල් දෙකකින් එකක් හරියට ම හරියන්නෙත් අනික දුර්වල වෙන්නෙත් කො-හොම ද ?" පින් ඇහුවා.

"ඔය කලින් කියපු දේවල්වලින් එකක් හරි, හරි

"ඔබ හරි" පන්ගේ කෙටි උත්තර කලාව අනික් දෙන්නටම ඇල්ලුවෙ නෑ. ප්‍රතිශත ගැන කතා කරන්න, විශ්ලේශනය කරන්න කැමති පැන්සල ඒකට උත්තර දෙන්න හරි බරි ගැහුණා. තමන්ට සියයට සියයක් ම හරියට යමක් කරගන්න ඕනනම් තමන්ගේ ඉළක්කය සියයට එකසිය විසිපහක්වත් වෙන්න ඕන. එතකොට වැරදුණ, අතපහු වුණ දේවල් අත ඇරුණාම අඩු තරමින් සියයට සියය කියන ඉළක්කයට ළඟාවෙන්නවත් පුළුවන් වෙයි. ඒකට ඒ විදියට හැම දෙයක්ම සැළසුම් කරගන්න වෙනවා. අර කිව්ව වගේ සියයට සියයක් ම සාර්ථකව ඉවර කරගන්න පුළුවන් දේවල් අඩුයි. ඒත් වැරදීම් අවම කරගන්න උත්සහ කරන එක වැඩිය හොඳා."

"නව් යූ ආ එරයිවින්ං ඈට් මෝටර්ගාඩින්ස්" කෝච්චියේ ශබ්දවාහිනී යන්තරේ මොර දුන්නා.

"හත්වළාමයි ! බහින්න තිබුණ ඉස්ටේසම පහුවෙලා නේද ?" පන් ඔළුවට අත තියාගත්තා.

"වෝටර් ගාඩින්ස්" වලටම ඇවිත්." පින් වට පිට බැළුවා.

"කතාවෙන් කතාවෙන් - මදැයි" පැන් ගමන් මල්ල කරේ දාගත්තා.

තුන්දෙනා එක්ක කෝච්චියෙන් බැහැලා ආපහු අතට එන කෝච්චියකට මාරු වුණා.

සන්නස
බලන්නට ඇති පත්තර අතර කියවන්නට ඇති පත්තරයක්

14 වන පිටෙන්



වෙනස් වුන ගමන් එතෙක් බලතලවල හිටපු තනතුරුවල හිටපු පිරිස ඉවත් කර තවත් පිරිසක් එම ස්ථානවලට පත් කිරීම. අපේ අත්දැකීම තමයි නැවතත් තනතුරුවලට පත්කරන්නේ ඒ සඳහා නුසුදුස්සන්. එය අදත් සිදුවෙමින් පවතිනවා. අපේ ඉල්ලීම වුනේ තනතුරුවලට නිසි පුද්ගලයන් පත්ක-රන්න කියන එක. කරුණාකර ගෞරවනීය නිසි මිනි සුන් ඒ තනතුරුවල තබන්න. අපි කී පමණින් මේ දේවල් සියයට සියයක් නිවැරදි නොවන බව අපි දන්නවා. නමුත් අපි උත්සහාය අත් අරින්නේ නැහැ. නුසුදුස්සන් ඒ ස්ථානවලින් ඉවත් කිරීම සඳහා අවසානය දක්වා අපේ සටන අපි අරගෙන යනවා.

**කලාකරුවන් සෑම විටම සමාජයට යමක් දෙනවා. ඒ වගේම ජනතාවගෙන් කලාකරුවනුත් සෑම විටම පාහේ යමක් ලබනවා. සමාජයට පෙරගමන්කරු-වෙකු වූ කලාකරුවෙක් ලෙස ඔබට මේ වන විට ජනතාවගෙන් ලැබී ඇත්තේ මොනවාද?**

මේ සමාජය අපට බොහෝ දේවල් දෙනවා. මේ සමාජය අපිව ආරක්ෂා කරනවා. මේ සමාජය අපට බොහෝ දේවල් උගන්නනවා. මට මතක් වෙනවා මට පහර දෙද්දී ආයුධ ගත්ත මැරයෝ ඉස්සරහට ඇවිත් සටන් කරන්න ඔවුන්ට ශක්තියක් තිබුනේ නැහැ. නමුත් ඒ මිනිස්සු මගේ කනට කරලා කිව්වා අනේ ජයතිලක සහෝදරයා මෙතනින් යන්න කියලා. පහුවදා අපි එයට විරෝධය පළකරද්දි විශාල පිරිසක් ඒකට එකතුවුණා. මම හිතන්නේ ඔවුන් අපිට ප්‍රතිඋපකාර කළා. හම්බන්තොටදී ඉරාජ් නමැති මැරවරයා තමන්ගේ මැරවර කණ්ඩායමක් එක්ක ආයුධ සන්නද්ධව ඇවිත් පිහි පිස්තෝල යකඩ පොලු අරගෙන ඇවිත් අපට පහර දෙනවා. හිස ඔසවන්නට බැරි විදියට පහර දෙනවා. පහර දීලා මාව ඇදගෙන යන්නට උත්සහා කළා. ඒ අස්සේත් මට ඇහෙනවා ගහන්න එපා ගහන්න එපා කියලා. ඒ තමයි අපි වැපිරුව මනුෂ්‍යයත්වයේ හඬ. මගේ ශරීරයේ තිබුණ බලසම්පන්න බව නිසා නෙවේ මම එදා බේරෙන්නේ. මා එදා බේරෙන්නේ ආදරණීය මිනිස්සු මාව රැකගත්ත නිසා. ඔවුන් ගුටිකෑව මා වෙනුවෙන්. ඔවුන් තුවාල ලැබුවා, අපහාස වින්දා මා වෙනුවෙන්. මේ සමාජයේ දුෂ්ඨ මිනිසුන් සිටිනවා සේම මේ සමා-ජයේ යහපත් හදවත් ඇති මිනිස්සුත් සිටිනවා. ඒ නිසා තමයි මම අද ඔබත් සමඟ මේ සම්මුඛ සාකච්ඡාව පවත්වන්නේත්. ඒ යහපත් මිනි සුන්ගේ ප්‍රතික්‍රියා නිසා බව අමතක නොකළ යුතුයි. යහපත් දෙයක් වැපිරුවොත් යහපත් දෙයක් ලැබෙනවා. මේ පොළව සරුසාරයි. හෙට දවස වෙනුවෙන් ඒ යහපත් දේ වැපිරිය හැකි බව මම විශ්වාස කරනවා. ඒ අස්වැන්න අපේ ජීවිත කාලය තුළ අපි ලබමින් පවතිනවා සහ ඊට වඩා යහපත් අස්වැන්නක් අපේ දරුවන්ට, අපේ දරුවන්ගේ දරුවන්ට නෙලාගන්න පුලුවන් බව මම විශ්වාස කරනවා.

සංවාද සටහන සහ ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න

විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com